# ගම්පහ ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ගම්පහ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.19,365,920 ක් වැයකර ඉදිකරවන ලද වැලිවේරිය සතිපොළ ප්‍රාග්ධනිත කිරීමේදී පරිත්‍යාග ලෙස ගිණුම්ගත නොකොට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමට බැරකර තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට රු.74,799,190 ක ලැබියයුතු මුද්දර ගාස්තු ශේෂය තුළ 2008 වර්ෂයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු ශේෂය රු.15,888,063 ක් විය. මෙම මුදලින් රු.14,518,970 ක් 2010 වර්ෂය තුළදී ලැබී තිබු අතර, සමාලෝචිත වර්ෂය තුළදීද ලැබියයුතු ලෙස දක්වා තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී ලැබියයුතු මන්ත්‍රී දීමනා රු.81,000 ක් දෙවරක් වෙන් කිරීම නිසා ලැබියයුතු මන්ත්‍රී දීමනා එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ආහාර පනතට අදාළව සිදුකරන ලද වැරදි සම්බන්ධව පවරන ලද නඩු සම්බන්ධයෙන් අයකර ගන්නා ලද දඩ මුදලින් 75% ක් පළාත් පාලන ආයතනයේ අරමුදලට බැරකර 25% ක් වරදකරු කිරීමට උත්සුක වූ නිලධාරියාට ප්‍රදානය කිරීමට තැන්පත් ගිණුමේ රඳවා තබාගත යුතු වුවත්, සභාව විසින් මුළු දඩ මුදලම තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2007 සිට 2012 වර්ෂය දක්වා එසේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ මුළු දඩ මුදල රු.973,332 ක් විය.

(ඉ) 2007 වර්ෂයේ සිට ලැබියයුතු ප්‍රාග්ධන ආධාර ණයගැතියන් රු.18,838,473 ක් අයකර ලබා ගැනීමට කටයුතු නොකර ගිණුම්වල ආයෝජන යටතේ දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳුනු පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 11 ට අදාළව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.296,422,834 ක් වු අතර, ඒවාට අදාළ උපලේඛන/ වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.263,452,446 ක් විය. ඒ අනුව නොසැසඳුනු වෙනස රු.32,970,388 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.84,216,728 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,498,820 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,918,515 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත, ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාවේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් හා බදු | 12,992 | 11,643 | 32,058 |
| (ii) | බදුකුලී | 1,129 | 1,131 | 41 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 688 | 726 | 1,257 |
| (iv) | වෙනත් ආදායම් | 5,368 | 5,134 | 2,684 |

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ මුදල් පහත පරිදි විය.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 13,363,505 |
| මුද්දර ගාස්තු | 74,799,190 |

(ආ) වර්ෂ 4 කට වඩා වැඩි රු.11,581,657 වූ ලැබියයුතු මුද්දර ගාස්තු හා වර්ෂ 5 කට වඩා වැඩි රු.7,363,505 ක්වූ උසාවි දඩ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) පළාත් ආදායම් කොමසාරිස්ගේ 2011 ජනවාරි 13 දිනැති බප/ආදා/කො/පොදු ලිපිය පරිදි උසාවි දඩ මුදල් අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වසර 5 ක් ඇතුළත අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් හෝ නම්කළ නිලධාරියෙකු විසින් සහතික කළ ලේඛන සහිතව ඉල්ලීම් ඉදිරිපත් කළයුතු බව දැක්වෙතත් උසාවි දඩ ලේඛනය අනුව විගණිත දින වන විට 2005, 2011, 2012 වර්ෂවල උසාවි දඩ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) මුද්දර ගාස්තු හිමිකම් පෑම වසර 3 කට සීමාකර තිබූ අතර, 2009 සහ 2012 වර්ෂවල කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් මුද්දර ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.3 <u>වරිපනම් බදු</u>

2013 අප්‍රේල් 30 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.29,877,269 ක්වූ අතර, එම ශේෂය තුළ වසර එකකට වැඩි කාලයක් ගතවූ රු.5,000 ට වැඩි ශේෂවල එකතුව රු.6,199,902 ක් විය.

2.2.4 <u>වෙනත් ආදායම්</u>

(අ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලිය රු.2,032,479 ක ශෙෂය තුළ වසරකට වඩා පැරණි රු.429,179 ක ශේෂයක් වූ අතර, කඩා ඉවත්කර ඇති කඩ කාමර 12 කින් අයවීමට තිබූ කුලී මුදල රු.191,402 ක්ද විය.

(ආ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කුලියට දීමෙන් 2007 වර්ෂයට පෙර සිට අයකරගත යුතුව පැවති රු.1,614,551 ක හිඟ භාණ්ඩ හා සේවා බදු වර්ෂ ගණනාවක් ගතවී ඇතත් අදාළ පාර්ශවයන් වෙතින් නිරවුල් කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

2.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ බද්දට දුන් වෙළඳ ස්ථාන වලින් වෙළඳ ස්ථාන 12 ක් වසාදමා තිබූ අතර, කඩ කාමර පැවරීමේදී විධිමත්ව ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා හිඟ මුදල් අයකිරීමට නීත්‍යානුකූලව කටයුතු කළ නොහැකිව තිබිණි. මෙම කඩ කාමර සභාවට පවරාගෙන කඩ කුලිය නැවත තක්සේරුකර ටෙන්ඩර් මගින් නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වසර 05කට වරක්වත් කඩ කුලිය සංශෝධනය කළයුතු වුවත් එසේ නොකර කඩ කාමර ඉදිකරන අවස්ථාවේදී අයකරන ලද කුලී මුදලම තවදුරටත් අයකරමින් පැවතිණි.

(ඇ) මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2012 යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ගවල අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරමේ (Inter Locking Concrete Block Paving) ව්‍යාපෘති 06 ක් සඳහා රු.3,000,000 ක් අනුමත වී තිබූ අතර, එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ආදායම් පරිපාලනය